BCI BENEDICT XVI Catholic Institute of Higher Education

# BCI ඉංග්‍රීසි කථන පුහුණු පාඨමාලාව

BCI ඉංග්‍රීසි කතා පුහුණු පාඨමාලාව එදිනෙදා ජීවිතයට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා නිපුණතාවය ඉලක්ක කර ගනිමින් විශේෂයෙන් සකස් වූ අනගි පාඨමාලාවකි. අන්තර්ජාතික පිළිගැනීමකින් යුත් බ්‍රිතාන්‍ය විභාග සඳහා භාවිතා වන පෙළපොත් පදනම් කර ගනිමින් පැවැත්වෙන මෙම පාඨමාලාවේ සෑම අදියරක්ම අවසානයේ BCI සහතික පත්‍රයක් පිරිනැමේ.

## 01. පාඨමාලා ව්‍යුහය

**BCI** ඉංග්‍රීසි පාඨමාලාව අදියර 4 කින් යුක්තය. එනම්...

- අ. Beginner Level
- ආ. Pre-Intermediate Level
- ඇ. Intermediate Level
- ඈ. Upper-Intermediate Level

## 02. පාඨමාලාවේ අන්තර්ගතය

සෑම අදියරක්ම සඳහා වෙන්වන කාලය මාස 4 කි. (පැය 60 කි)

ඔක්ස්වර්ඩ් (Oxford) විශ්ව විද්‍යාලය විසින් ප්‍රකාශිත ‘Speak Now’ පොත් පෙළ මෙම පාඨමාලාවේ පෙළ පොතයි. උච්චාරණයට සහ එදිනෙදා භාවිතා වන ව්‍යවහාර ඉංග්‍රීසි සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇති අතර කතා කිරීමේ සහ සවන්දීමේ ක්‍රියාකාරකම් වැඩි වශයෙන් එක්කර තිබේ. කියවීම සහ ලිවීමද මීට ඇතුලත්වේ.

## 03. ඇතුළු වීමේ සුදුසුකම්

1. **වයස් සීමාව:** වයස අවු. 16 ට වැඩි ඕනෑම ශිෂ්‍යයකු, පාසැල් හැර ගිය අයකු, රැකියාවක නියුතු හෝ රැකියාවක් අපේක්ෂාවෙන් පසුවන අයකුට මීට සම්බන්ධ විය හැකිය.
2. **අවම අධ්‍යාපන සුදුසුකම්:** අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ඉංග්‍රීසි බස සමත් වී තිබීම සෑහේ.
3. **ඇතුලත් කර ගැනීමේ ලිඛිත පරීක්ෂණය**
   අයදුම්කරුවන් සියලු දෙනා ඇතුලත්කර ගැනීමේ විභාගයට (Entrance Exam) පෙනී සිටිය යුතු අතර විභාගයෙන් අවම වශයෙන් ලකුණු 20 ක් ලබා ගත යුතුය. පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත ශිෂ්‍යයා ඇතුලත් වන පාඨමාලා අදියර තීරණය කෙරේ.

## 04. වාර අවසන් විභාග

සෑම අදියරක්ම අවසානයේ පැවැත්වෙන විභාග ප්‍රතිඵලය අනුව අදියරකින් අදියරකට උසස් කිරීම සිදු වේ. තවද එම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් ශිෂ්‍යයා/ශිෂ්‍යාව දිනපතා පැමිණීම 80% මට්ටම රඳවා ගත යුතු වෙයි. මෙම විභාගය සමත් සිසුන්ට BCI සහතික පත්‍රය පිරිනැමේ.

## 05. පංති පැවැත්වෙන දිනයන් සහ වේලාවන්

**අ.** සති අන්තයේ සෙනසුරාදා පැවැත්වෙන පාඨමාලාව පෙරවරු 8.15 සිට පස්වරු 12.45 දක්වා

**ආ.** සති අන්තයේ ඉරිදා පැවැත්වෙන පාඨමාලාව පෙරවරු 8.15 සිට පස්වරු 12.45 දක්වා

## 06. පාඨමාලා ගාස්තු

| | |
|---|---|
| ඉල්ලුම් පත් ගාස්තුව | රු. 250/- |
| ලියාපදිංචි ගාස්තුව | රු. 600/- |
| පාඨමාලා ගාස්තුව | රු.19,400/- |

*(පෙළ පොත් ගාස්තුවද ඇතුළුව)*

*පළමු වාරිකය - රු 10,300/- දෙවන වාරිකය - රු 9,700/-*

## 07. පාඨමාලාවට අයදුම් කළ හැකි ආකාරය

**අ.** www.bci.lk හරහා අප වෙබ් අඩවියට පිවිස online අයදුම්පත් පිරවිය හැකිය. අයදුම්පත් පිරවීම කල හැක්කේ වෙබ් අඩවිය ඔස්සේ පමණකි. ලිඛිත අයදුම්පත් බාර නොගන්නා අතර online අයදුම්පත් පිරවීමට සහය අවශ්‍ය නම් අප කාර්යාලයට පැමිණ ලියාපදිංචි විය හැක.

**ආ.** වෙබ් අඩවිය ඔස්සේ ලියා පදිංචි වීමෙන් පසු අප කාර්යාලයට පැමිණ අයදුම්පත් අංකය (Online Application Reference No) සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ඇතුලත් කර ගැනීමේ විභාග ප්‍රවේශ පත්‍රය (Entrance Exam Admission Slip) ලබා ගත යුතුය.

**ඇ.** ඇතුලත් කර ගැනීමේ විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයා පැමිණිය යුත්තේ දෙන ලද පත්‍රිකාවේ සඳහන් දිනයේ පමණි. විභාගය සඳහා පැමිණෙන විට ජාතික හැඳුනුම්පත සහ විභාග ප්‍රවේශ පත්‍රය (Admission Slip) රැගෙන ආ යුතුය.

**ඈ.** (www.bci.lk) වෙබ් අඩවිය ඔස්සේ ඇතුල් කර ගැනීමේ විභාගයේ ප්‍රතිඵල ඔබට දැනගත හැකිය.

**ඉ.** පාඨමාලාව සඳහා තේරුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාඨමාලාවට අදල ගාස්තු බැංකුවට ගෙවා බැංකු ලදුපත ද අදල සෙසු ලේඛණ ද කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පාඨමාලාව ඇරඹීමට අවම වශයෙන් සතියකට පෙර තම පැමිණීම තහවුරු කර ඇතුලත් කර ගැනීමේ ලිපිය (Letter of Admission) ලබා ගත යුතුය.

## 08. කොන්දේසි

**අ.** ගාස්තු මුදල් ගෙවූ පසු පාඨමාලාවට නොපැමිණීම හෝ මඟදී එය නතර කිරීම නිසා ගෙවූ මුදල් ආපසු ලබා ගත නොහැක.

**ආ.** පාඨමාලාවේ ස්වභාවය සහ කාලවකවානු ආදී කාරණා ගැන ලියාපදිංචි වීමට පෙර දැනුවත් වී සිටීමට අපේක්ෂකයා වගකීමෙන් බැඳී සිටියි.

**ඇ.** BCI ආයතනයට සම්බන්ධ වූ පසු සෑම සිසුවෙක්ම එහි විනය නීති මාලාව පිළිපැදීමට බැඳී සිටියි.

**විමසීම්**
**16 වන බෙනඩික්ට් කතෝලික උසස් අධ්‍යාපන ආයතනය**
නො. 495, මිනුවන්ගොඩ පාර,
බෝලවලාන, මීගමුව.
**031-222 4 422 / 031-222 4 333**
**0766 98 97 97**
www.bci.lk | info@bci.lk